# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1987 අංක 45 දරන පුරවැසි (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1987 නොවැම්බර් මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 නොවැම්බර් මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ගතහැකිය

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1987 අංක 45 දරන පුරවැසි (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 නොවැම්බර් මස 25 වන දින]

එල්. ඩී—ඕ. 38/87.

**පුරවැසිභාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1987 අංක 45 දරන පුරවැසි (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**349 වන අධිකාරයේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. පුරවැසි පනතේ 19 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් ඒ වගන්තිය නැවත අංක කිරීමෙන්,

(2) නැවත අංක කරනු ලැබූ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් :—

"(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ 20 වන වගන්තිය යටතේ හෝ 21 වන වගන්තිය යටතේ හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසන් කරන යම් තැනැත්තකු විසින්, ඔහු වෙනත් යම් රටක පුරවැසියකු වුවද, එලෙස නොකඩවා පුරවැසියකු වන්නේ වුවද, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය නැවත අත්කරගනු ලැබූ බවට ප්‍රකාශයක් සඳහා අමාත්‍යවරයා වෙත ඉල්ලීමක් ඉන්පසු කවර හෝ අවස්ථාවක ඉදිරිපත් කළ හැකි ය. තවද, ඒ ප්‍රකාශය කිරීම සම්බන්ධයෙන් සියලු අවස්ථාගත කරුණු අනුව ශ්‍රී ලංකාවේ යහපත සඳහා වන බවට අමාත්‍යවරයා සෑහීමට පත්වුවහොත්, ඉල්ලීම කරනු ලැබුවේ යම් ප්‍රකාශයක් සඳහා ද ඒ ප්‍රකාශය අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ 20 වන වගන්තිය යටතේ හෝ 21 වන වගන්තිය යටතේ හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුවීම අවසන් කිරීමට පෙර යම් අවස්ථාවක, ශ්‍රී ලංකාවේ කවර හෝ පුරවැසියකු විසින්, ඔහු වෙනත් යම් රටක පුරවැසියකු වීමේ දින සිට සහ ඉන් පසුව පුරවැසියකු වුවද ඒ ප්‍රකාශයේ නිශ්චිතව සඳහන් දින සිට සහ ඉන්පසුව ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ඒ තැනැත්තා විසින් තබා ගන්නා බවට ප්‍රකාශයක් සඳහා අමාත්‍යවරයා වෙත ඉල්ලීමක් කළ හැකි ය. තවද, ඒ ප්‍රකාශය කිරීම විෂයය සම්බන්ධයෙන් සියලු අවස්ථාගත කරුණු අනුව ශ්‍රී ලංකාවේ යහපත සඳහා වන බවට අමාත්‍යවරයා සෑහීමට පත්වුවහොත් ඉල්ලීම කරනු ලැබුවේ යම් ප්‍රකාශයක් සඳහා ද ඒ ප්‍රකාශය අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි ය.

2—ඒ 099140—7,235 (87/09)

(4) (2) වන උපවගන්තිය යටතේ හෝ (3) වන උප වගන්තිය යටතේ හෝ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරනු ලැබ ඇති අවස්ථාවක ඔහු වෙනත් යම් රටකද පුරවැසියකු වුවද, අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා විසින් ප්‍රකාශයේ නිශ්චිතව සඳහන් කරනු ලබන යම් දිනයක සිට හෝ නොකඩව පවත්වා ගෙන යන දිනයක සිට ඔහුට ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය නැවත ලැබිය හැකි ය.

(5) (2) වන උපවගන්තිය යටතේ හෝ (3) වන උප වගන්තිය යටතේ හෝ ප්‍රකාශයක් යම් තැනැත්තකු සම්බන්ධයෙන් බලාත්මකව ඇති තාක් කල් යම් තැනැත්තකු පුරවැසියකු වන්නේ වෙනත් යම් රටක ද ඒ වෙනත් රටේ පුරවැසිභාවය අත්හැරීමට ඔහුට නියම කරනු ලබන්නේ යයි මේ පනතේ විධිවිධාන කියවා තේරුම් නොගත යුතු ය.

(6) (2) වන උපවගන්තිය යටතේ හෝ (3) වන උප වගන්තිය යටතේ හෝ ප්‍රකාශයක් කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට 23 වන වගන්තියේ සහ 24 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(7) (2) වන උපවගන්තිය යටතේ හෝ (3) වන උප වගන්තිය යටතේ හෝ ප්‍රකාශයක් කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් නොකඩව සිටීම ශ්‍රී ලංකාවේ යහපත පිණිස නොවන ආකාරයකින් ඔහු හැසිරී ඇති බවට අමාත්‍යවරයා සෑහීමට පත් වුවහොත් යටකී ප්‍රකාශය අමාත්‍යවරයා විසින් කවර හෝ අවස්ථාවක දී ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.".

(3) ඒ වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත දැක්වෙන අලුත් පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

"පුරවැසිභාවය අත්හැරීම සහ ද්විත්ව පුරවැසිභාවයට අදාළ විශේෂ විධිවිධාන.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 යි. (විදේශීය) රු. 200 යි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා, පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.